C
320.9
PUR

# ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය

1964 සිට 1990 දක්වා යුගය පිළිබඳ
විශේෂ අධ්‍යයනයකි.

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ
ශාස්ත්‍රපති උපාධිය සඳහා සම්පාදිත
පර්යේෂණාත්මක නිබන්ධය

**පී. එල්. ටී. පුරසිංහ විසිනි.**

488378

දේශපාලන විද්‍යා අධ්‍යනාංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය
පේරාදෙණිය.

1995

UNIVERSITY OF PERADENIYA
7-12-1996
LIBRARY

## උද්දේශය

ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාර උප අංගයක් වශයෙන් ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය හැඳින්විය හැක. මුල් යුගයේ පටන් මේ රටේ වාමාංශික ව්‍යාපාරයේ ප්‍රධානතම බලවේගය වූ ලංකා සමසමාජ පක්ෂය ට්‍රොට්ස්කිවාදී 4 වැනි කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ලංකා ශාඛාව වශයෙන් ක්‍රියාත්මක විය. 1964 දී ලංකා සමසමාජ පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රජයට හවුල්වීම හෙවත් ධනේශ්වර සභාග දේශපාලනයට අවතීර්ණවීම හේතුකොටගෙන 4 වැනි කොමියුනිස්ට් අන්තර් ජාතික-යෙන් ල.ස.ස.ප.ය නෙරපා හරින ලදී. එහිදී ල.ස.ස.ප.යේ සභාගවාදයට විරුද්ධව දැඩි ට්‍රොට්ස්කිවාදී ස්ථාවරයක කටයුතු කළ එම පක්ෂයේ සුළුතර කණ්ඩායමක් පක්ෂයෙන් බිඳී ගොස් ධනේශ්වර සභාගවාදයට විරුද්ධව මේ රටේ ට්‍රොට්ස්කිවාදී දේශපාලනයේ අඛණ්ඩතාව ඇති කරන ලදී.

1964 දී ල.ස.ස.ප.යෙන් බිඳී ගිය ට්‍රොට්ස්කිවාදී කණ්ඩායම් හා පසුකාලීනව ල.ස.ස.ප.යේ මාධ්‍යමික සභාගවාදයට විරුද්ධවූ ට්‍රොට්ස්කිවාදී කණ්ඩායම් විසින් ගෙනයනු ලැබූ දේශපාලන ක්‍රියාදාමය පරීක්ෂා කිරීම මෙම අධ්‍යයනය මගින් සිදු කෙරේ.

මෙම නිබන්ධයේ හැඳින්වීම මගින් අධ්‍යයනයේ ගැටළුව හා පරීක්ෂණ ක්‍රමවේදය ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය තුළ ලංකා සමසමාජ පක්ෂය දැරූ ආධිපත්‍යයටත්, ලාංකීය දේශපාලන ක්‍රමය තුළ එම පක්ෂය විසින් පවත්වාගෙන ගිය බලපෑම් සහගත තත්වයටත් සමාන්තර වීමට 1964 පටන් එම පක්ෂයෙන් බිඳීගොස් සංවිධානය වූ ට්‍රොට්ස්කිවාදී දේශපාලන පක්ෂවලට හැකියාවක් නොතිබීම පිළිබඳ ගැටළුව අධ්‍යයනයේ ගැටළුව වශයෙන් මෙහිදී යොදා ගැනුණි. එමෙන්ම අධ්‍යයනය සඳහා ඓතිහාසික හා තුලනාත්මක ක්‍රමවේදය යොදා ගන්නා ලදී.

නිබන්ධයේ පළමුවන පරිච්ඡේදය වෙන්වී ඇත්තේ ලංකාවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය හා 4 වන කොමියුනිස්ට් ජාත්‍යන්තරය අතර පැවති සම්බන්ධතාව විග්‍රහ කිරීමටය. එහිදී 1964 දක්වා ල.ස.ස.ප.ය සමග 4 වන ජාත්‍යන්තරය පවත්වාගෙන ගිය සම්බන්ධතාව ප්‍රථමයෙන් විග්‍රහ කෙරෙන අතර දෙවැනි කොටස යටතේ විග්‍රහ කෙරෙන්නේ 1964 සිට 1990 දක්වා මේ රටේ ට්‍රොට්ස්කිවාදී සංවිධාන 4 වන ජාත්‍යන්තරය සමග ගෙනගිය සබඳතාවන් සහ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ විඛණ්ඩනය කෙරෙහි 4 වන ජාත්‍යන්තරයේ විඛණ්ඩනයන් බලපෑ ආකාරය පිළිබඳවය.

දෙවන පරිච්ඡේදය වෙන්වී ඇත්තේ ලංකාවේ සුළු ධනේශ්වර රැඩිකල් ව්‍යාපාරය වූ ජනතා විමුක්ති පෙරමුණ හා ට්‍රොට්ස්කිවාදී පක්ෂ අතර පැවැති සබඳ-තාවන් හා ට්‍රොට්ස්කිවාදී පක්ෂ ජනතා විමුක්ති පෙරමුණ පිළිබඳව කරන ලද විග්‍රහයන් ඇගයීම සඳහාය.

වර්තමාන ලංකාවේ කේන්ද්‍රීය දේශපාලන ගැටළුව බවට පත්වී තිබෙන ජාතික ප්‍රශ්නය සම්බන්ධයෙන් ට්‍රොට්ස්කිවාදී සංවිධාන දරණ ආකල්ප හා ඉදිරිපත් කර ඇති විසඳුම් පරීක්ෂා කිරීම සඳහා තුන්වන පරිච්ඡේදය වෙන් කර තිබේ.

හතරවන පරිච්ඡේදය මගින් 1964 න් පසු වර්ධනය වූ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය විසින් පෙරමුණු දේශපාලනය සම්බන්ධයෙන් දැරූ ආකල්ප හා ගනු ලැබූ ක්‍රියාමාර්ග යනාදිය සාකච්ඡා කෙරේ.

අධ්‍යයනයේ අවසාන පරිච්ඡේදය හෙවත් පස්වන පරිච්ඡේදය මගින් 1964 සිට 1990 දක්වා ලංකාවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය පිළිබඳව සමාලෝචනයක් සිදුකරමින් අනෙකුත් පරිච්ඡේද තුළ කළ ඇති විග්‍රහයන් හා දත්තවලට අදාළව නිගමනයන් ඉදිරිපත් කරනු ලැබේ.

---------